**ද්විතීය නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය (ණය අංක 2276 - SRI) 2013**

---

ද්විතීය නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර එළඹි ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 කොටස සහ 2006 දෙසැම්බර් 14 දිනැති අංක 2276 SRI දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ( ශ්‍රී.ලං.ර.) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ද්විතීය නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නියෝජිතායතනය වේ. ණය අංක 1993 SRI (එස්එෆ්) යටතේ එජඩො මිලියන 60.3 ක වටිනාකමක් 2003 අගෝස්තු 18 දින දී ආසියානු සංවර්ධන බැංකුව අනුමත කර තිබුණි. උතුරු මැද පළාතේ නාගරික ප්‍රදේශ සහ ග්‍රාමීය ප්‍රදේශ පහක 969,000 ක් වන ජනතාවට සුරක්ෂිත ජලයද 171,500 ක් වන ජනතාවට සනීපාරක්ෂාවද සැපයීමත් ජල කේන්ද්‍රික ආයතන සවිබල ගැන්වීම මගින් සුරක්ෂිත ජලය සැපයීමේ ධාරිතාව වැඩිකිරීමත් ව්‍යාපෘතියේ අරමුණු වේ. මූලික ඇගයීමේ සිට දැඩි මූල්‍ය විචලතාවයන් හේතුවෙන් මා වැඩ ඉදිකිරීම හා සම්පූර්ණ කිරීම, පිරිපහදු නොකළ ජලය ගෙනයාමේ මධ්‍යස්ථානය හා පිරිපහදු යන්ත්‍ර ( දිනකට ඝන මීටර 40,000 ක්) සහ පිරිපහදු කළ ජලය ගෙනයාමේ ජල නල (කි.මී 36 )සැලසුම් කිරීම, ඉදිකිරීම සැපයීම හා එලීම හා උස් ජල කුළුණු 07 ක් ඉදිකිරීම හා බෙදාහැරීමේ ජල නල සැපයීම හා එලීම (කි.මී. 145 ක්) උස් ජල කුළුණු ඉදිකිරීම හා මුතූර් ග්‍රාමීය ප්‍රදේශයේ වැසි ජලය ගලා යාම වැඩි දියුණු කිරීම සම්පූර්ණ කිරීම හා ඉදිකිරීම ලගාකර ගැනීමට ආසියානු සංවර්ධන බැංකුව අතුරු ණයක් (ණය අංක 2276 - SRI)අනුමත කර තිබුණි. අතුරු ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය එජඩො මිලියන 70.5 දක්වා වැඩි කර ඇති අතර එයින් එජඩො මිලියන 46.5 ක් හෝ සියයට 66 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකග වී ඇති අතර එජඩො මිලියන 24 ක් හෝ සියයට 34 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට එකග වී ඇත. පිරිවැය ඉක්මවා යාමේ ප්‍රතිඵලයක් ලෙස, ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කළ මුළු ඇස්තමේන්තු වටිනාකම එජඩො මිලියන 48.79 ක් වැඩිකර තිබුණු අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය ද එජඩො මිලියන 41.87 දක්වා වැඩිකර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිත විය. පසුව ව්‍යාපෘති කාලය 2012 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රජය විසින් සිදුකළ මූල්‍ය ප්‍රතිපාදන මත ව්‍යාපෘති කටයුතු 2013 දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා

කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී . ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 76,795,902 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.9,767,167,456 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් කාලය සඳහා ව්‍යාපෘති වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් අයිතමය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 67,760,664 | 372,819,470 | 5,859,830,348 |
| උපකරණ සහ ද්‍රව්‍ය | 9,035,238 | 146,935,500 | 3,748,751,922 |
| පොලී ගාස්තු | - | 19,976,386 | 158,585,186 |
| **එකතුව** | **76,795,902** | **539,731,356** | **9,767,167,456** |

### 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකිවූ තොරතුරු අනුව, 2013 වර්ෂයේ දී අග්‍රිම අරමුදල් ගිණුමක් විවෘත කර නොතිබුණි.

## 5. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරුවන් දෙදෙනකු සඳහා වැඩ අවසන් කිරීමේ සහතික නිකුත් කර තිබුණද මාර්ග යථා තත්වයට පත් කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සිදු කළ රු. මිලියන 5 ක් වටිනා බැංකු ඇපකර 2014 ජූලි 31 දින වන විටත් ව්‍යාපෘතිය විසින් ආපසු ලබා ගෙන නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් ඇප අරමුදල් සඳහා බදු වශයෙන් කොන්ත්‍රාත් ගෙවීම මත සියයට එකක් අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් ව්‍යාපෘතිය එම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි.

(ඇ)වටිනාකම රු.67,654 ක ශුද්ධ විදේශ විනිමය වෙනස මූල්‍ය ප්‍රකාශන වල ජංගම වගකීම් යටතේ වැරදි ලෙස දක්වා තිබුණි.

(ඇ)මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව, උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගැනීමට රු. මිලියන 43 ක් 2013 දී වියදම් කර තිබුණි. කෙසේ වෙතත් ලැබීම් හා ගෙවීම් ගිණුම අනුව එය රු. මිලියන 66 ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගැනීමට සිදු කළ ගෙවීම් රු.මිලියන 23 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද සිවිල් වැඩ සඳහා 2013 දී සිදු කළ ගෙවීම් වටිනාකම රු. මිලියන 125 ක් ලැබීම් හා ගෙවීම් ගිණුමේ රු. මිලියන 178 ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වන ලද සිවිල් වැඩ සඳහා ගෙවීම රු. මිලියන 53 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ අවශ්‍යතාවයන් අනුව, ව්‍යාපෘතියේ ගණුදෙනු අභ්‍යන්තර විගණන ඒකකය විසින් විගණනය කර නොතිබුණි.

(ඊ) වාර්තා අනුව, පාෂාණ ද්‍රව්‍ය ඝන මීටර 7910 ක් කැණීම් කර තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 58 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘති කටයුතු වලට භාවිතා කළ බවට හෝ එවැනි පාෂාණ ද්‍රව්‍ය විකුණු බවට තහවුරු කර ගත හැකි කිසිදු සාක්ෂියක් විගණනයට ලබා ගත නොහැකි විය.

(උ)කාර්ය මණ්ඩල පුහුණුව සහ පරිපාලන ගොඩනැගිල්ල සඳහා ගෘහ භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම සඳහා සිදුකළ රු. මිලියන 8.6 ක ප්‍රතිපාදන වටිනාකම බැකෝ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා භාවිතා කර තිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) නියමිත කාල පරිච්ඡේදය තුළ ප්‍රතිපාදිත සම්පත් භාවිතයෙන් ව්‍යාපෘති අරමුණු සපුරාගැනීම තහවුරු කරගැනීමට මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික ලෙස සමස්ථ ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි වගකීම් සහිතව භෞතික හා මූල්‍ය ඉලක්ක උද්දීපනය වන පරිදි පුළුල් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතුය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය විසින් එවැනි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අරමුදල් මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිලිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ලබාදීමට එකඟ වු වටිනාකම | | 2013 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදන | සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ආ.සං.බැ. | 48.80 | 5,500.80 | 2.16 | 2.15 | 48.8 | 5,490.94 |
| ශ්‍රී.ලං.ර | 41.87 | 4,720.10 | 245.94 | 175.67 | 36.8 | 4,066.71* |
| එකතුව | 90.67 | 10,220.90 | 248.1 | 177.82 | 85.6 | 9,557.65* |

* මූල්‍ය ප්‍රකාශන වලට අනුව, ශ්‍රී ලංකා රජයේ දායකත්ව වටිනාකම රු. මිලියන 4,133.03 ක් සහ වෙනස රු.මිලියන 66.32 ක වටිනාකමකි. කරුණාකර මෙම වාර්තාවේ 4.1 (අ) ඡේදය බලන්න.

## 6.2 භෞතික ප්‍රගතිය

----------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, එජඩෝ මිලියන 63.24 ක කොන්ත්‍රාත් 4 ක් ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතිය ආරම්භයේදීම අපේක්ෂිත විය. කෙසේ වෙතත් ඇස්තමේන්තු පිරිවැය එජඩෝ මිලියන 90.66 ක් ලෙස 2010 දී සංශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 43.3 ක ප්‍රතිශතයේ වැඩිවීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයට හේතු වී ඇත. කෙසේ වෙතත් කොන්ත්‍රාත්තුවේ සැලකිය යුතු ප්‍රමාණයක් 2012 අප්‍රේල් 30 දිනට සම්පූර්ණ කර ඇතත් එක් කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් වූ අවසන් බිල 2014 ජූලි 31 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා අදාල කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැය අගය කිරීමට විගණනයේ දී නොහැකි වී තිබුණි.

(ආ) ඉහත ඡේදයේ සඳහන් කළ කොන්ත්‍රාත් අතුරින්, මා වැඩ, පිරිපහදු නොකළ ජලය ගෙනයාමේ මධ්‍යස්ථානය හා පිරිපහදු යන්ත්‍ර (සැලසුම, සැලසුම් කිරීම හා ඉදිකිරීම) (පීජ් 1) සහ පිරිපහදු කළ ජලය ගෙනයාමේ ජල නල සැපයීම හා එලීම හා උස් ජල කුළුණු ඉදිකිරීම (පීසී 1) යන කොන්ත්‍රාත්තු දෙක ඉදිකිරීම් අවසන් කිරීමේ දිනයන් සමඟ සසඳන කල පිලිවෙලින් මාස 19 කින් හා මාස 21 කින් ප්‍රමාද වී තිබුණි. එම ව්‍යාපෘති දෙක ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත බාර දී තිබුණු අතර පිළිවෙලින් 2011 ඔක්තොම්බර් 20 හා 2012 අප්‍රේල් 30 තාවකාලික සම්පූර්ණ කිරීමේ සහතික නිකුත් කර තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් අවසන් සම්පූර්ණ කිරීමේ සහතික 2014 මැයි අවසන් වන විටත් අවසන් කර නොතිබුණි.